# පෙරවදන

ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාවෙහි අ.පො.ස (උසස් පෙළ) සංස්කෘත විෂය සඳහා මෙම විෂය නිර්දේශය සම්පාදිත ය. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මෙම සංස්කෘත විෂය නිර්දේශය පාසල් හා පිරිවෙන් පද්ධතියෙහි ක්‍රියාත්මක වීමට නියමිත ව ඇත්තේ 2017 වර්ෂයේ සිට ය.

ලෝකයේ පවත්නා සම්භාව්‍ය භාෂා අතුරින් සංස්කෘත භාෂාවට අද්විතීය ස්ථානයක් හිමි වේ. සිංහලයේ මව්බසක් වන මෙම සංස්කෘත භාෂාව හැදෑරීම ලොව කවර ජාතියකටත් වඩා වැදගත් වනුයේ ශ්‍රී ලාංකේය අපට ය. මනා පෞරුෂයක් සහිත පරිපූර්ණ මිනිසකු බිහි කිරීමට ශක්තිය ඇති සංස්කෘත භාෂාව නූතන ශ්‍රී ලාංකේය සමාජය විසින් නවීන භාෂා විද්‍යාත්මක ක්‍රමවේද ඔස්සේ හැදෑරිය යුතු ආකාරය මෙම විෂය නිර්දේශයෙන් පෙන්වා දී ඇත. නිපුණතා පාදක විස්තරාත්මක විෂය නිර්දේශයක් වන මෙයින් ශිෂ්‍යයා විභාගයට සූදානම් කිරීම එක ම අරමුණ ලෙස නොසැලකේ. ගැඹුරු භාෂා ඥානයක් ශිෂ්‍යයාට ලබා දෙන අතර රසවින්දනාත්මක හා විචාරාත්මක කුශලතා ශිෂ්‍යයා තුළ වර්ධනය කිරීමත් සම්භාව්‍ය භාෂාවක් හැදෑරීමෙන් ලැබෙන පරිචය අත්පත් කර දීමත් මෙම සංස්කෘත විෂය නිර්දේශයෙන් අපේක්ෂා කෙරේ.

2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිත මෙම නව සංස්කෘත විෂය නිර්දේශය සඳහා අවශ්‍ය මග පෙන්වීම් ඇතුළත් ගුරු මාර්ගෝපදේශ දෙකක් 12 සහ 13 ශ්‍රේණි සඳහා ඉදිරියේ දී හඳුන්වා දෙනු ඇත. විභාග කඩ ඉම ජය ගන්නා අතර ම භාෂා ඥානයෙන් හා මනා පෞරුෂයකින් හෙබි සදාචාර සම්පන්න පරිපූර්ණ මිනිසකු වීමට මෙම විෂය නිර්දේශය විද්‍යාර්ථීනට අත්වැලක් වේවා යනු අපගේ ප්‍රාර්ථනාව යි.

සංස්කෘත විෂය නිර්දේශ සම්පාදක මණ්ඩලය

